


*පාකෙන්හම් දුම්රිය ස්ථානයේ ඉදිකිරීම් සිදුවෙමින් පවතී*

SINHALESE

**පාකෙන්හම්**, 2024 මැයි

# බූම් ගේට්ටු ඉවත්වන අතර දුම්රිය ස්ථාන විවෘත වනු ඇත

LEVEL CROSSING REMOVAL PROJECT

## ජුනි 3 වන සඳුදා නව පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන විවෘත කිරීමට පෙර පාකෙන්හම්හි මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට් සහ රේස්කෝර්ස් රෝඩ් හි ඇති බූම් ගේට්ටු සදහටම ඉවත්ව යනු ඇත.

නව ඉහළට එසවුණු පාකෙන්හම් දුම්රිය ස්ථානය තාවකාලික ප්‍රවේශවීමේ පහසුකම් සහිතව විවෘත වනු ඇත. වැඩ කරන අය මේ අතරතුර දුම්රිය ස්ථාන පරිශ්‍රයේ වැඩ කටයුතු සිදු කරනු ඇත.

නව ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයද පරිශ්‍රය සහ පහසුකම් මගීන් හට ලබා ගත හැකි වනසේ විවෘත වනු ඇත. පහසුකම් අතර රථ වාහන 300 ක් සඳහා ඉඩකඩ, වැඩිවෙන ප්‍රජාව සඳහා අමතර ප්‍රවාහන සම්බන්ධතා ඇත.

ගමන් කිරීමට පහත පුරුක වෙත ගොස් කාලසටහන බලා ගන්න
**ptv.vic.gov.au/cranpak**

ජුනි මුල් භාගය වන තෙක් දැනට පවතින පාකෙන්හම් දුම්රිය ස්ථානය කඩා ඉවත් කිරීම සහ කිමී 2.5 ක් දිග දුම්රිය පාලමේ වැඩ කටයුතු අවසන් කිරීම සඳහා වැඩ පිරිස් විසින් පැය විසි හතර පුරා කඩිනමින් ඉදිකිරීම් කටයතු සිදු කරනු ඇත.

නව දුම්රිය පාලමේ දුම්රිය ගමන් කරන අතර බූම් ගේට්ටු ඉවත්වීම හේතුවෙන් මෙල්බර්න්හි වඩාත්ම අවිවේකී දුම්රිය මාර්ගය වඩා විශ්වාසනීය වන අතර රියදුරන් සහ පදිකයන් හට පළාතේ පාරවල් වඩා ආරක්ෂාකාරී වනු ඇත.

**මෙම බූම් ගේට්ටු ඉවත් කිරීම මගින් 2025 වන විට දුම්රිය හරහා දිවෙන පාරවලින් තොර මාර්ගයක් ඇති කිරීමට උපකාර වන අතර, මේ මගින් පළාත්වාසීන් ජීවත්වන, වැඩ කරන සහ ගමන් කරන ආකාරය වෙනස් වනු ඇත.**

### ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම්හි නවතම දුම්රිය ස්ථාන
- මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට් සහ රේස්කෝර්ස් රෝඩ් හි ඇති බූම් ගේට්ටු සදහටම ඉවත්ව යනු ඇත
- උදෑසන ජනාකීර්ණම වේලාවල මිනිත්තු 30 කට අධික බූම් ගේට්ටු නිසා වසා තබන කාලය ඉවත්ව යනු ඇත
- සෑම සතියේ දිනකම වාහන 63,000 ක ගමන් කාලය ඉතිරි කරනු ඇත
- පොදු ප්‍රවාහන සේවාවලට වැඩිපුර ප්‍රවේශය
- පාකෙන්හම් අවට ප්‍රදේශයේ වැඩි ආරක්ෂාව සහ වඩා යහපත් ප්‍රවාහන සම්බන්ධතා
- එම්.සී.ජී. හයක ප්‍රමාණයක නව ප්‍රජා විවෘත අවකාශ

# නව දුම්රි ස්ථාන සහ දුම්රිය පාරවල් දුම්රිය ගමනට සූදානම් කිරීම

නව දුම්රිය පාලම දුම්රිය ගමනට සූදානම් කිරීම සහ මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට් සහ රේස්කෝර්ස් රෝඩ් හි ඇති බූම් ගේට්ටු ඉවත් කිරීම සඳහා **ජූනි 3 වන සඳුදා** දක්වා අපි පැය විසි හතර පුරා වැඩ කටයුතු සිදු කරමින් සිටිමු.

සිදු කරන වැඩ කටයුතු අතර පහත දේ ඇතः

— සෑම දුම්රිය හරහා දිවෙන පාරකම ඇති බූම් ගේට්ටු ඉවත් කිරීම

— නව සහ පවතින දුම්රිය මාර්ග සම්බන්ධ කිරීම

— දුම්රිය පාළමේ සහ ඊස්ට් පාකෙන්හම්හි නව දුම්රිය මාර්ග පරීක්ෂා කිරීම

— දැනට පවතින පාකෙන්හම් දුම්රිය ස්ථානය කඩා ඉවත් කිරීම

— සංඥා සහ ඉහලින් ඇති වැඩ කටයුතු සම්පූර්ණ කිරීම

— නව පාකෙන්හම් දුම්රිය ස්ථානයේ උතුරු අත්තිවාරම ගොඩනැගීම.

මෙම කටයුතු අවසාන කල පසු, දුම්රිය ගමන ආරම්භ කරන අතර පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන **ජූනි 3 වන සඳුදා** සිට මගීන් හට විවෘත වනු ඇත.



පාකෙන්හම්හි වර්ණවත් කුළුණු




ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයේ පදික වේදිකා සංඥා පුවරුව

## ඔබ ගමන් කරන ආකාරයට සිදුවන වෙනස්කම්

අප වැඩ කටයුතු සිදු කරන අතරතුර, ඔබ ප්‍රදේශයේ ගමන් කරන ආකාරයට වෙනස්කම් සිදු වනු ඇත.

### පාකෙන්හම් දුම්රිය මාර්ගය

පහත වේලාවන්හිදී පාකෙන්හම් මාර්ගයේ දුම්රිය වෙනුවට බස්රථ ධාවනය වනු ඇතः

— **ඩැංඩිනොන්ග් සහ පාකෙන්හම්** අතර **මැයි 17 වන සිකුරාදා පව 9.30 සිට මැයි 21 වන අඟහරුවාදා අවසාන සේවාව දක්වා**

— **බර්වික් සහ පාකෙන්හම්** අතර **මැයි 22 බදාදා සිට මැයි 31 වන සිකුරාදා අවසාන සේවාව දක්වා සහ**

— **ඩැංඩිනොන්ග් සහ පාකෙන්හම්** අතර **ජූනි 1 වන සෙනසුරාදා සිට ජූනි 2 වන ඉරිදා අවසාන සේවාව දක්වා.**

ඔබගේ ගමන **ptv.vic.gov.au/cranpak** වෙතින් හෝ පී.ටී.වී. ඇප් එක ඔස්සේ සැලසුම් කර ගන්න.

### මාර්ග වසා තැබීම්

McGregor බූම් ගේට්ටු ඉවත් කිරීම සඳහා කඩිනමින් වැඩ කරන අතර කෙටි කාල සඳහා මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට් සහ රේස්කෝර්ස් රෝඩ් හි දුම්රිය හරහා දිවෙන මාර්ග ඇති තැන්වල පාරවල් වසා දමනු ඇත.

ප්‍රජාවගේ සහ කාර්ය බලකායේ ආරක්ෂාව සඳහා රථවාහන කළමණාකරනය සහ මාර්ග වෙනස් කිරීම සිදු කරනු ඇත. ව්‍යාපෘති ප්‍රදේශයේ ගමන් කරන අතරතුර මාරග සංඥා සහ උපදෙස් පිළිපදින්න.

ජූනි මැද භාගයේ මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් පාරවල ආරම්භ කරන වැඩිදුර මාර්ග කටයුතු සඳහා පසු පිට බලන්න.

**මෙම වැඩ කටයුතු අවසාන කරන අතරතුර ප්‍රදේශවාසීන්, මගීන් සහ පළාතේ වෙළෙඳුන් ඉවසීම සම්බන්ධයෙන් අපි ඔවුනට ස්තුතිවන්ත වෙමු.**



පාකෙන්හම් දුම්රිය ස්ථානයේ වහලයේ ඇති සෝලර් පැනල් සහ ස්කයි ලයිට්

# ඔබගේ නව දුම්රිය ස්ථානය ජුනි 3 වන සඳුදා විවෘත වනු ඇත

## පාකෙන්හම් දුම්රිය ස්ථානය

නව පාකෙන්හම් දුම්රිය ස්ථානය සම්පූර්ණවූ විට එය නගරයේ මධ්‍ය ලක්ෂ්‍යය වන අතර ඒ මගින් පළාතේ සබඳතා පහසු සහ ආරක්ෂාකාරී වනු ඇත.



*නව පාකෙන්හම් දුම්රිය ස්ථානයේ සම්පූර්ණ කරන ලද දකුණු පස කැනපිය.*

### ඊස්ට් පාකෙන්හම් දෙසට ඇති ප්‍රවේශය

**ජුනි 3 වන සඳුදා** පාකෙන්හම් දුම්රිය ස්ථානය විවෘතවූ විට, ඊස්ට් පාකෙන්හම් දෙසට ඇති ජදික වේදිකාවේ තාවකාලික තරප්පු තිබෙනු ඇත. සෝපාන හෝ රැම්ප් මගින් යාමට අවශ්‍ය අය හට අප විසින් කාඩීනියා රෝඩ් දුම්රිය ස්ථානය සහ පාකෙන්හම් දුම්රිය ස්ථානය අතර ෂටල් බස් සේවාවක් ධාවනය වනු ඇත.

දුම්රිය ස්ථාන පරිශ්‍රයේ වැඩ කටයුතු සිදුවනු ඇත. ඒවා අතර නව බස් රථ ඉන්ටර්චේන්ජය, රථ ගාල, 2 වන ජදික වේදිකාවේ සෝපාන සහ තරප්පු සහ දුම්රිය ස්ථානයේ ෆෝර්කෝර්ට් වැඩ කටයුතු වසන්ත ඍතුව දක්වා සිදු කරනු ඇත.

අප එම්.සී.ජී. හයක පමණ ප්‍රමාණයක නව අවකාශ සම්බන්ධයෙන්ද වැඩ කටයුතු සිදු කරනු ඇත. මේවා අතර උද්‍යාන, ක්‍රීඩාගාර, බාස්කට් පන්දු භාගයක පෙදෙසක්, ක්‍රියාකාරී අවකාශ සහ ඇවිදීමට සහ පාපැදි පැදීමට මංතීරු ඇත. නව විවෘත අවකාශය මෙම වසන්ත ඍතුවේදී විවෘත කරනු ඇත.

**පාකෙන්හම් දුම්රිය ස්ථානයේ ඇති ලක්ෂණ**

- බෝල්ඩ් හිල් රෝඩ් වෙතින් අමතර රථවාහන 450 කට ඉඩකඩ
- කැපවුණු නංවා ගැනීමට සහ බැස්සවීමට ඇති කලාප
- පොදු වැසිකිලි සහ කියෝස්ක් වැනි දියුණු පහසුකම්
- ඇතුලත් කල බස් රථ ඉන්ටර්චේන්ජය
- උණුසුම පාලනය කල හැකි විවේකාගාර
- වැඩිදියුණු කල විදුලි එළිය සහ සීසීටීවී
- උදෑසන පළමු දුම්රිය සිට රාත්‍රියේ අවසාන දුම්රිය තෙක් ප්‍රවේශ පත්‍ර කාර්යාලයේ කාර්ය මණ්ඩලය සිටී
- නව පාකීට්ර් යතුරු පැදි ගබඩා කිරීම සහ පාපැදි හූප්

## ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානය

අප විසින් මෙට්‍රොපොලිටන් දුම්රිය මාර්ගය කිලෝමීටර් දෙකකින් දික් කල අතර, මෙම වර්ධනය වන පළාතේ ප්‍රජාවට සේවය කිරීම සඳහා ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානය ගොඩ නගන ලදී.

නව දුම්රිය ස්ථානය විවෘත කරන අතර පරිශ්‍රය සහ පහසුකම් අවසන් කර ඇති අතර මගීන් හට භාවිතයට සූදානම්ය.

**ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයේ ඇති ලක්ෂණ**

- රථවාහන 300 කට ඉඩකඩ
- කැපවුණු නංවා ගැනීමට සහ බැස්සවීමට ඇති කලාප
- පාපැදි හූප්
- මයිකි පහසුකම් සහ ආරක්ෂණ සේවා නිලධාරී Protective Services Officer (PSO) කාර්යාලයක්
- ලැන්ඩ්ස්කේප් කල ප්‍රදේශ
- විදුලි එළිය සහ සීසීටීවී කැමරා



මේන් ස්ට්‍රීට්, පාකෙන්හම්

# මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ් වැඩ

අප විසින් පැරණි දුම්රිය යටිතල පහසුකම් ඉවත් කිරීම සහ මාර්ග රිසර්ෆස් කිරීම සඳහා ජුනි මැද භාගයේ සිට මේන් ස්ට්‍රීට් සහ මැක්ග්‍රෙගර් රෝඩ් වසා තබනු ඇත. අප විසින් මේන් ස්ට්‍රීට් හි නව වටරවුමක්ද තනනු ඇත.

මෙම වැඩ සම්බන්ධ වැඩිදුර විස්තර ඉදිරි සතිවල ප්‍රජාව හට ලබාදෙනු ඇත.

## බිග් බිල්ඩ් රෝඩ්ස්

මැයි සහ ජුනි මාසවල පාකෙන්හම් මාර්ග වැඩිදියුණු කිරීම සහ හීල්ස්විල් කූ වී රජ මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ කටයුතුද සිදුවනු ඇත.

**bigbuild.vic.gov.au/roads** වෙත යාම මගින් ඔබගේ ගමන සැලසුම් කර ගන්න.

## පාකෙන්හම් වෙළඳුන් හට උපකාර කිරීම

**මෙම වැඩ කටයුතු ශීත සහ වසන්ත ඍතුවේදී සිදුවන අතර ඔබගේ පළාතේ සාප්පු සංකීර්ණ විවෘතව තබනු ඇත.**

මෙම වැදගත් කටයුතු සිදු කරන අතර ඔබගේ සහයෝගයට අපගේ ස්තුතිය. කරුණාකර සාප්පු සවාරි යාම, ආහාර අනුභව කිරීම මගින් පාකෙන්හම් වෙළඳුන් හට දිගටම උපකාර කරන්න.

## ව්‍යාපෘති කාලවකවානු

### 2019
- ස්ථාන ගවේශණය
- තාක්ෂණික සහ ඉංජිනේරු ඇගයීම
- ප්‍රජා සහභාගිත්වය

### 2021
- ප්‍රජා සහභාගිත්වය
- වැඩිදුර ඉංජිනේරු සහභාගිත්වය
- දුම්රිය ස්ථාන සැලසුම් නිවේදනය කිරීම
- විවෘත අවකාශ සම්බන්ධ ප්‍රජා සහභාගිත්වය
- කල්තියා කරන වැඩ කටයුතු

### 2022
- ඉදිකිරීම
- විවෘත අවකාශ සැලසුම නිකුත් කිරීම

### 2023
- ඉදිකිරීම

### 2024 මැද භාගය
- වැඩි යහපතට බූම් ගේට්ටු ඉවත්වීම
- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන විවෘත කිරීම
- පාකෙන්හම් දුම්රිය ස්ථානය පරිශ්‍රය, දකුණු පස රථ ගාල, බස් රථ හුවමාරුවන ස්ථානය, විවෘත අවකාශය සහ ලැන්ඩ්ස්කේපින් වැඩ කටයුතු දිගටම සිදුවනු ඇත

### 2024 අග භාගය
- පාකෙන්හම් දුම්රිය ස්ථානය සම්පූර්ණවීම
- ප්‍රජා අවකාශ විවෘතවීම

*කාලවකවානු වෙනස්වීම්වලට යටත්වේ